## 6. පුරස්ථ ග්‍රන්ථියේ පිළිකා

**රෝග ලක්ෂණ**

- අවශ්‍යතාව ඇතත් මුත්‍රා පහකිරීමේ අපහසුතාව
- මුත්‍රා කිරීම ඇරඹීමේ හා මුත්‍රාධාරාව පවත්වා ගැනීමේ අපහසුතා
- මුත්‍රා කිරීමෙන් පසු ද සම්පූර්ණයෙන්ම මුත්‍රා පිට නොවුනා සේ දැනීම
- නිතර නිතර මුත්‍රා යෑම
- රාත්‍රියට මුත්‍රා කිරීමේ වාර ගණන වැඩිවීම
- මුත්‍රා සමග ලේ පිටවීම




## 7. තයිරොයිඩ් ග්‍රන්ථියේ පිළිකා

**රෝග ලක්ෂණ**

- තයිරොයිඩ් ග්‍රන්ථියේ විශාලවීමක් හෝ වෙනසක්
- ගෙලෙහි වසාගැටිති ඉදිමීමක්
- හේතුවක් රහිත කටහඬේ ගොරෝසු බවක්
- ගෙලෙහි වේදනාවක්
- ගිලීමේ අපහසුවක්
- හුස්ම ගැනීමේ අපහසුවක්



**පහත රෝග ලක්ෂණ සති තුනකට වඩා පවතීද?**

- මුඛයේ සුදු හෝ රතු ලප මතුවීමක්
- ගෙල /තයිරොයිඩ් ග්‍රන්ථියේ ඉදිමුමක්
- කල් අල්ලා පවතින ගිලීමේ අපහසුවක් හෝ අජීර්ණ තත්ත්වයක්
- මළපහ කිරීමේ/මුත්‍රා කිරීමේ පුරුදුවල වෙනසක් හෝ ඒ සමග ලේ පිටවීමක්
- කටහඬෙහි වෙනසක්
- කල් අල්ලා පවතින කැස්ස හෝ කැස්ස සමග ලේ පිටවීම
- පියයුරුවල හෝ අන් තැනක ගැටයක් හෝ ඝනවීමක්
- කාන්තාවක් නම් යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය ස්‍රාවයක් හෝ රුධිරය පිටවීමක්
- ගැටයක, ලපයක හෝ ඉන්නෙකුගේ හදිසි වෙනස් වීමක් හෝ ශීඝ්‍ර වර්ධනයක්
- සුව නොවන තුවාලයක්

**එසේ නම් ඒවා පිළිකාවක ලක්ෂණ වීමට ද ඉඩ ඇත.**

හැකි ඉක්මනින් වෛද්‍ය උපදෙස් ලබාගන්න.


**ජාතික පිළිකා මර්දන වැඩසටහන**

555, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථනය: 011-2368627, 011-3159227
E-mail: nccpsl@yahoo.com Web: www.nccp.health.gov.lk


මුද්‍රණය: බෙස්තාගිර පොත් මුද්‍රණාලය දුරකථනය: 011-2390111

# පිළිකාව කලින් හඳුනාගැනීමෙන් ජීවිතය ජයගනිමු !



**පිළිකාවලින් 1/3 ක්ම කලින් හඳුනාගැනීමෙන් සම්පූර්ණයෙන් සුවකළ හැකිය**

**ඔබේ ශරීරයේ දිගටම පවතින යම් වෙනසක් ඇතිනම් වහාම වෛද්‍යවරයෙකු හමුවන්න**